# ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාලවල වර්තමාන භූමිකාව පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

ඩබ්ලිව්.පී. එස්. කරුණාරත්න

FGS/L/MSSc/2007/03

2014

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1210 |
| වර්ග අංකය: | |

## නිබන්ධන සාරාංශය

විශ්වවිද්‍යාල පුස්තකාලයක භූමිකාව පුළුල් පරාසයක විහිදී පවතින අතර මෙම අධ්‍යයනය මඟින් අධ්‍යයන හා පර්යේෂණ ක්‍රියාවලියට සහ උපයෝජකයන්ගේ තොරතුරු සාක්ෂරතාව වර්ධනය කිරීමේදී විශ්වවිද්‍යාල පුස්තකාලවල භූමිකාව පිළිබඳ සොයා බලන ලදී. මෙම භූමිකා ක්‍රියාත්මක වීම; පුස්තකාල සම්පත්, කාර්යමණ්ඩලය, මූල්‍ය ප්‍රතිපාදන යනාදී විවිධ විචල්‍යයන් මත රඳා පවතී. එසේම මෙම විචල්‍යයන්, පුස්තකාල පිළිබඳ පුද්ගලයන්ගේ ආකල්ප යනාදී කරුණු සම්බන්ධයෙන් වත්මන් පුස්තකාල විවිධ ගැටලු හා බාධකවලට මුහුණ දෙනු ලැබේ. මෙවන් පසුබිමක අධ්‍යයන හා පර්යේෂණ කාර්යය සම්බන්ධයෙන් හා තොරතුරු සාක්ෂරතාව වර්ධනය කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල පුස්තකාලවල භූමිකාව නිසි පරිදි ඉටු වේද යන්න ගැටලුවකි.

ඒ අනුව අධ්‍යයන පර්යේෂණ කාර්යයන් සපුරා ගැනීමේදී හා උපයෝජකයන්ගේ තොරතුරු සාක්ෂරතාව වර්ධනය කිරීමේදී විශ්වවිද්‍යාල පුස්තකාල විසින් ඉටුකරන කාර්යභාරය කුමක්ද යන්න හා වර්තමාන තත්ත්වය සොයා බැලීම හා එකී කාර්යයන්ට සහාය දැක්වීමේදී විශ්වවිද්‍යාල පුස්තකාල මුහුණ දෙන ගැටලු හා බාධක සොයාබැලීම හා ඒවාට විසඳුම් ඉදිරිපත් කිරීම මෙම අධ්‍යයනයෙන් සිදු විය. බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ප්‍රධාන විශ්වවිද්‍යාල පහකින් එක් විශ්වවිද්‍යාලයකින් 20 බැගින් ශිෂ්‍යයන් 100 දෙනෙක් හා ආචාර්ය මණ්ඩලය 100 දෙනෙක්ගෙන්ද එක් විශ්වවිද්‍යාලයකින් 4 බැගින් පුස්තකාලයාධිපතිවරුන් 20 දෙනෙකුගෙන්ද ප්‍රශ්නාවලි මඟින් ලබාගත් දත්ත ආශ්‍රයෙන් ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව දත්ත විශ්ලේෂණය කරන ලදී.

දත්ත විශ්ලේෂණයට අනුව දැනට පවතින පුස්තකාල එකතුව, සේවා හා පහසුකම් අධ්‍යයන පර්යේෂණ ක්‍රියාවලියට හා තොරතුරු සාක්ෂරතාව වර්ධනය කිරීමට සහාය වීමේදී ප්‍රමාණවත් නොවේ. පාඨකයන්ට අවශ්‍ය පාඨ ග්‍රන්ථ, වාර සඟරා, ඒවායෙහි නව සංස්කරණ, පිටපත් සංඛ්‍යාව යනාදිය හා කියවීම් ශාලා, පරිගණක හා අන්තර්ජාල පහසුකම් ප්‍රමාණවත් නොවීම පාඨකයන් මුහුණ දෙන ප්‍රධාන ගැටලු වේ.

අධ්‍යයන හා පර්යේෂණ කාර්යයට සහාය වීමේදී ප්‍රමාණාත්මක හා ගුණාත්මක එකතුවක් මනාව සංවිධානය කර පවත්වාගෙන යාම, ග්‍රන්ථ ප්‍රතිග්‍රහණයේදී පොදු එකතු සංවර්ධන ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම, විද්‍යුත් මූලාශ්‍ර වැඩි වශයෙන් ප්‍රතිග්‍රහණය කිරීම, අන්තර් පුස්තකාල සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පුස්තකාල පහසුකම් හා සේවාවන් වැඩිදියුණු කිරීම කළ යුතුය. එසේම තොරතුරු සාක්ෂරතාව වර්ධනය කිරීමට සහාය වීමේදී පුස්තකාලයාධිපතිවරු විසින් ආචාර්ය මණ්ඩලයේ සහයෝගීත්වය ඇතිව තොරතුරු සාක්ෂරතා වැඩසටහන් මනාව සැළසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම, ඇගයීම් පැවරුම් ලබා දෙමින් සක්‍රිය ලෙස වැඩසටහන් පවත්වාගෙන යාම කළ යුතු අතර විෂයමාලාවලට තොරතුරු සාක්ෂරතා වැඩසටහන් හා පාඨමාලා ඇතුළත් කිරීමට අදාළ බලධාරීන්ව දැනුවත් කළ යුතුය. එසේම පුස්තකාලයාධිපතිවරුන් අධ්‍යාපනය ලබා දෙන්නන් බවට පත්විය යුතු අතර පුස්තකාල, ඉගෙනීම ඉගැන්වීම, පර්යේෂණය, තාක්ෂණය යනාදියේ සංයෝජනයෙන් යුත් ඉගෙනුම් මධ්‍යස්ථාන බවට පත් කළ යුතුය.

ප්‍රමුඛ පද : විශ්වවිද්‍යාල, විශ්වවිද්‍යාල පුස්තකාල, විශ්වවිද්‍යාල පුස්තකාල භූමිකා, අධ්‍යයන පර්යේෂණ කාර්යය, තොරතුරු සාක්ෂරතාව

## Abstract

It is conceivable to identify university libraries as academic libraries where it comprises with educational and research events of students and academic staff of a parent institute. Library plays an epic role in an educational institute since all the knowledge based activities occur around it. This study has mainly focused on major two roles subsequently the library role is a foremost feature to be considered. Namely, the role playing by the library for education (Teaching and Learning process), research operations and development of the information literacy of the users of library facility.

The study focuses on revealing the effect of university libraries on academic and research work and development of information literacy by focusing to the present context. Moreover, it emphases on providing recommendations to the challenges facing by university libraries when providing main requirements at last.

Research was carried out in main five universities of western province in Sri Lanka and data collected through questionnaires from various focused groups. Sample was consists with 100 students, 100 lecturers and 20 librarians (with assistant librarians) from all five universities.

Responses from the questionnaires were analyzed to identify the role of university libraries and it found that existing libraries and its facilities are not adequate to fulfill the requirements of academic research process and to improve the information literacy. The reference books, term magazines, its new versions/ editions, number of copies and study halls, computer and internet facilities are not adequate for the readers as per the research findings.

In conclusion, there should be balance a between quantitative and qualitative information which is vital for bookworms, adhere to a common collective development policy when acquiring books, quire more electronic references/tools, develop international library collaborations and take necessary actions to improve library facilities and services. Moreover, it is vital to get the support from academic staff when developing programmes to mature information literacy and carryout programmes with ongoing assignments and provide the guidance to add information literacy programmes to the curriculum. Further, librarians should be the facilitators of library education and library should be a knowledge hub for the education, research and information technology.

**Key words:** universities, university libraries, university library role, education and research work, information literacy